

# අපේ යහපැවැත්ම

එස්.එන්.ලියනආරච්චිගේ

රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

LIVEWORKSHEETS

## යහපැවැත්ම යනු

අප තුළ යහපත් පුරුදු ඇති කරගෙන
ඒවා පවත්වාගෙන යාම යහපුරුදු ලෙස හැඳින්වේ.

## අපේ යහපැවැත්ම උදෙසා අප

පොත්පත් හොඳින් පරිහරණය කළ යුතුය.

පන්තිකාමරය පිරිසිදුව තබා ගත යුතුය.

යහපත් දරුවෙකු විය යුතුය.



LIVEWORKSHEETS

## පොත්පත් අපිරිසිදු වීමට හේතු

- ❑ පොත් පොඩි වී තිබීම.
- ❑ පොත් භාවිතයෙන් පසු වසා නොතැබීමෙන් කුණු හා දූවිලි ගෑවීම.
- ❑ පිට කවරය ඉරී හෝ ගැලවී ඇතිවිට අලුත් කවරයක් නොදැමීමෙන්.
- ❑ කිළිටි අත්වලින් පොත් ඇල්ලීම නිසා.

## පොත්පත් හොඳින් පරිහරණය කළ යුතු ආකාරය



- ❑ පොත්වලට පිටකවර දැමිය යුතුය.
- ❑ පොත්වල කොළ ඉරීමෙන් වැළකිය යුතුය.
- ❑ පොත්වල අනවශ්‍ය දේ ලිවීමෙන් වැළකිය යුතුය.
- ❑ පොත්වල මුළු කොන් නොනැවෙන සේ පාවිච්චි කළ යුතුය.

LIVEWORKSHEETS

## දුවේ පුතේ මේ බලන්න ඔයාලා වැඩියෙන්ම කැමති මොන පන්තිකාමරයටද?

A




B



LIVEWORKSHEETS

## පන්තිය පිරිසිදුව තබා ගැනීමට කළ යුතු දේවල්

- හොදින් පන්තිය අතුගෑම.
- වතුර බෝතල් , පොත්පත් පිළිවෙලට තබා ගැනීම.

## පන්ති කාමරය පිළිවෙලට පිරිසිදුව තබා ගැනීමෙන් අපට ලැබෙන වාසි.

- ඉගෙනීමට ආසාවක් ඇතිවීම.
- දිනපතා පාසල් පැමිණීමට ආසාවක් ඇතිවීම.

LIVEWORKSHEETS

## යහපත් දරුවෙකු ගැන කියවෙන කවි පෙළකට සවන් දෙමු

යහපත් දරුවෙකුගේ ගුණාංග ගැන කියවීන "සිරිමත් මගෙ සකි යහපත් ළමයෙකි.." කවි පන්තියට සවන් දෙමු



LIVEWORKSHEETS

## යහපත් දරුවෙකු සතු ගුණාංග.

- කාලසටහනකට අනුව පිළිවෙලින් දවස ගෙවයි.
- වැඩිහිටියන්ට ගුරුවරුන්ට කීකරුයි.
- උදව්වක් අවශ්‍ය වූ කෙනෙකුට උදව් කරයි.
- අනෙකුත් අය සමග සංයමයෙන් යුතුව කතාකරයි.
- යහළුවන් සමග සුහදව කටයුතු කරයි.

LIVEWORKSHEETS

## ක්‍රියාකාරකම 01

**යා කරන්න.**

| | |
|---|---|
| අපි උදේම | අන් අයට උදව් කරමු. |
| පන්තිය පිරිසිදුව හා | සමගිව කටයුතු කරමු. |
| ගුරුවරුන්ට | පාසලට පැමිණෙමු. |
| යහළුවන් සමග | කීකරු වෙමු. |
| හැකි සෑම විටම | පිළිවෙලකට තබා ගනිමු. |

LIVEWORKSHEETS

ක්‍රියාකාරකම 02

## හිස්තැන් පුරවන්න.

- අපි අපේ...................... පිරිසිදුව තබා ගත යුතුය.
- මම පාසලේ................................හැසිරීම් පවත්වාගෙන යන හොඳ දරුවෙකි.
- අපි...................... වෙමු.

පන්තිය    කීකරු    යහපත්

LIVEWORKSHEETS